**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය ( උ මා ස ව්‍යා ) - සාමාන්‍ය මෙහෙයුම් 2012**

---------------------------------------------------------------------------------------------------------------

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති නියමයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම, රු.7,573,416,263 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.8,775,671,805 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| කාර්යාලීය උපකරණ | 334,007 | 466,351 | 800,358 |
| පරිගණක උපකරණ | - | 655,500 | 655,500 |
| වැඩ පූර්ව අත්තිකාරම් | - | 1,659,798,683 | 539,293,238 |
| කොන්ත්‍රාත් ගෙවීම් | 7,172,837,255 | 520,404,701 | 7,693,241,957 |
| අධීක්ෂණ උපදේශක | | | |
| - ජාතික මහා මාර්ග | 184,198,978 | 12,471,002 | 196,669,980 |
| - පළාත් මාර්ග | 133,418,072 | 79,553,021 | 212,971,093 |
| සමීක්ෂණ / පරීක්ෂණ ගාස්තු | 300,000 | 1,053,376 | 1,353,376 |
| වර්ධක වියදම | 34,412,665 | 24,881,124 | 59,293,788 |
| පොලී / බැඳීම් ගාස්තු | 47,915,286 | 22,327,804 | 71,392,515 |
| | 7,573,416,263 | 2,321,611,562 | 8,775,671,805 |

### 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එදිනට එම ගිණුමේ පැවති ශේෂය සාරාංශ කර පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| | ---------- | ---- |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 27,127.61 | 3,089,870 |
| එකතු කළා - ඌන පූර්ණයන් | 233,580.31 | 28,699,191 |
| විදේශ විනිමය වාසිය | - | 1,470,558 |
| | ------------ | ------------ |
| | 260,707.92 | 33,259,619 |
| අඩුකළා - ආපසු ගැනම් | 249,017.11 | 31,773,007 |
| | -------------- | ------------- |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 11,690.81 | 1,486,612 |

## 3. විගණන නිරීක්ෂණ

----------------------

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද තක්සේරුව අනුව මාසික කුලිය රු.210,000 ක් හෝ වර්ෂයක කාලයක් සඳහා කලින් ගෙවිය යුතු සම්පූර්ණ මාසික කුලිය රු.2,280,000 ක් (මාසිකව රු.190,000 බැගින් ) විය යුතුය. කෙසේ වුවද මාසික කුලිය රු.200,000 ලෙස සලකමින් වාර්ෂික කුලී කලින් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගෙවිය යුතු මුදලට වඩා රු.120,000 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ සේවා කාලය වෙනුවෙන් ව්‍යාපෘති නිලධාරීන්ගේ පාරිතෝෂික දීමනා සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.2,330,428 ක මුදලක් ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. පාරිතෝෂික දීමනා සඳහා හිමිකම් නොලැබූ නිලධාරීන් 4 දෙනෙකු සඳහා ගෙවූ රු.173,034 ක මුදලක්ද මෙම මුදලට ඇතුළත්ව තිබූ බව නිරීක්ෂණය විය.

3.2 **සැලසුම් කිරීම හා මෙහෙයවීම**

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කරනු වස් , මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදි වශයෙන් වගකීම් ස්ථාපිත කර මූල්‍ය හා භෞතික ඉලක්කයන් දක්වමින් සම්පූර්ණ ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද එවැනි සැලැස්මක් පිළියෙල කර කයාත්මක කර නොතිබුණි.

(ආ) ඉටුකර ගත යුතු ඉලක්කයන් සහිතව ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් හා කාල පරිච්ඡේදය තුළ සිදුකළ යුතු කාර්යයන්ට අදාළ අයවැයගත ප්‍රතිපාදනය නිසැකව හඳුනාගත හැකිවන පරිදි ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීමට හා සකස් කළ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට ව්‍යාපෘතියේ ප්‍රගතිය සමස්තයක් වශයෙන් විධිමත්ව ඇගයීම් කළ නොහැකි විය.

3.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් බිල්පත්‍ර ඉදිරිපත් කර හා සහතික කර නොමැති වුවත්, කොන්ත්‍රාත් පැකේජ 12 කට අදාළව රු.මිලියන 1,017 ක මුදලක් ගෙවිය යුතු ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී මුළු දිග ප්‍රමාණය කිලෝමීටර් 125.16 ක් වූ මාර්ග පැකේජ 8 ක් රු.මිලියන 7,922.5 ක පිරිවැයකට පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම සම්පූර්ණ කළ යුතුය. කෙසේ වුවද මුළු දිග ප්‍රමාණය කිලෝමීටර් 41.54 ක් වූ මාර්ග පැකේජ 3 ක පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම රු.මිලියන 2,295.2 පිරිවැයකට සම්පූර්ණ කර තිබූ අතර ඉතිරි මාර්ග පැකේජ 5 හි භෞතික කාර්ය සාධනය සයයට 70 සිට සියයට 91 ක් පමණක් විය.

4. **මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

-------------------------------------

4.1 **අරමුදල් උපයෝජනය**

----------------------

මුල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වු තොරතුරු අනුව සලසන ලද අයවැය ප්‍රතිපාදන හා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| | ණය ගිවිසුමේ සැපයීමට එකඟ වු මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ අයවැයගත ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | | | උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2012 දෙසැ. 31 දක්වා | | |
| | එ ජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන | % |
| ආ ස බැ | 130 | 14,950 | 5,000 | 38.87 | 4,963.37 | 59.57 | 7,228.38 | 48.34 |
| ශ්‍රී ලං ර | 16 | 1,823 | 50 | - | 17 | - | 21.94 | 1.2 |
| | 146 | 16,773 | 5,050 | 38.87 | 4,980.37* | 59.57 | 7,250.32* | 43.22 |

* කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් හා උපචිත වියදම් ඉවත් කිරීම හේතුවෙන් ඉහත සංඛ්‍යා මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදලින් වෙනස් වේ.

### 4.2 භෞතික කාර්ය සාධනය

#### 4.2.1 මාන්කුලම් සිට මුලතිව් දක්වා (කි.මී. 13 සිට කි.මී.24 ) ඒ 034 මාර්ගය පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම

2012 වර්ෂය සඳහා ප්‍රගත වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ඉලක්ක කරන ලද සියයට 100 ක ප්‍රගතියෙන් සියයට 72.64 ක තථ්‍ය ප්‍රගතියක් පමණක් ඉටුකර ගෙන තිබුණු බැවින් තථ්‍ය ප්‍රගතිය ඉලක්කයට වඩා අඩුවෙන් පැවති බව දැක්වේ. මාර්ග පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම පිළිබඳ ප්‍රධාන සංරචකයන්හි විස්තරාත්මක ප්‍රගතිය පහත දැක්වේ.

| විස්තරය | 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය<br>ප්‍රතිශතය |
|---|---|
| නිරවුල් කිරීම හා බිම සකස් කිරීම | 96.00 |
| ඉවුරු බැඳීම | 93.31 |
| උප - පදනම | 86.00 |
| පදනම | 60.00 |
| ඇස්පෝල්ට් ක්‍රියාවලිය | 39.41 |
| පාලම් - බීම් පාලම් | 87.00 |
| - ෂෙල් පාලම් | 97.00 |

| | |
|---|---|
| පෙට්ටි බෝක්කු | 97.00 |
| දිය බැස්ම මාර්ග | 95.00 |
| අඩි පාරවල් | ආරම්භ කර ඇත. |

සමාලෝචිත වර්ෂය තුළ සියළුම වැඩ නිම කිරීමට ඉලක්ක කර තිබුණද බෝක්කු වැඩ , පාලම් , මාර්ග දිය බැස්ම සහ කි.මී. 13 සිට කි.මී.24 දක්වා ප්‍රවේශ මාර්ගවල මාර්ග පුනරුත්ථාපන / වැඩිදියුණුකිරීම් 2012 දෙසැම්බර් 31 වන විටත් නිම කර නොතිබුණි. ඉවුරු බැඳීම හා පදනම සඳහා ද්‍රව්‍ය නොමැති වීම හා තාර හඟකම හේතුවෙන් කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කිරීමට ඉල්ලා සිටි බව මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ දන්වා තිබුණි.

### 4.2.2 මාන්කුලම් සිට මුලතිව් දක්වා ( කි.මී. 38 + 500 සිට කි.මී. 49 + 100 ) ඒ 034 මාර්ගය පුනරුත්ථාපනය කිරීම / වැඩිදියුණු කිරීම

---

2012 වර්ෂය සඳහා ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය සඳහා ඉලක්ක කරන ලද සියයට 100 ක ප්‍රගතියෙන් තථ්‍ය ප්‍රගතිය සියයට 62.14 ක් පමණක් ඉටුකර ගෙන තිබුණු බැවින් තථ්‍ය ප්‍රගතිය ඉලක්කයට වඩා අඩුවෙන් පැවතුණි. මාර්ග පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම පිළිබඳ ප්‍රධාන සංරචකයන්හි විස්තරාත්මක ප්‍රගතිය පහත දැක්වේ.

| **විස්තරය** | **2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය** |
|---|---|
| | **ප්‍රතිශතය** |
| නිරවුල් කිරීම හා බිම සකස් කිරීම | නිම කර ඇත. |
| ඉවුරු බැඳීම | 40.00 |
| උප - පදනම | 63.21 |
| පදනම | 82.00 |
| ඇස්පෝල්ට් ක්‍රියාවලිය | 55.01 |
| පාලම් | 98.00 |
| පෙට්ටි බෝක්කු | 95.00 |
| දිය බැස්ම මාර්ග | 89.00 |

සමාලෝචිත වර්ෂය තුළ සියළු වැඩ නිම කිරීම සඳහා ඉලක්ක කර තිබුණද බෝක්ක , පාලම් , දිය බැස්ම මාර්ග සහ කිලෝ මීටර් 38+500 සිට කිලෝ මීටර් 49+100 දක්වා ඇති ප්‍රවේශ මාර්ග පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීමේ වැඩ 2012 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. අවශ්‍ය බලපත්‍ර ලබාගැනීමට හා අත්කරත්ත ( Barrows Pits ) යොදා ගැනීමට අනුමැතිය ලබාගැනීමේදී වූ ප්‍රමාදයන් නිසා කොන්ත්‍රාත්කරුට අපහසුතා වූ බවත් ඒ හේතුවෙන් පස් වැඩ ප්‍රමාදවීමත් තාර හිඟකමත් සහ අහිතකර දේශගුණික තත්ත්වයන් හේතු කොට ගෙන වැඩ ප්‍රමාද වූ

බවත් ව්‍යාපෘති අධ්‍යක්ෂ මේ මේ සම්බන්ධයෙන් දනවා තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කිරීම් ඉල්ලා තිබුණි.

**4.2.3 නවට්කුලි සිට කෙරතිවු දක්වා ( කි.මී. 0 සිට කි.මී. 17+400 දක්වා ) ඒ 032 මාර්ගය පුනරුත්ථාපනය කිරීම / වැඩිදියුණු කිරීම**

---

(අ) 2012 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ඉලක්ක කරන ලද සියයට 99.20 ක ප්‍රගතියෙන් , තථ්‍ය ප්‍රගතිය සියයට 90.90 ක් පමණක් ඉටුකර ගෙන තිබුණු බැවින් තථ්‍ය ප්‍රගතිය ඉලක්කයට වඩා අඩුවෙන් පැවතුණි. කොන්ත්‍රාත්කරු විසින් 2013 මාර්තු 28 දිනට බොහෝ දුරට නිමකළ බවත් , තාර හිඟකම හේතුවෙන් දින 50 ක කාලය දීර්ඝ කිරීමක් ලබාදුන් බවත් මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ දක්වා තිබුණි.

(ආ) මාර්ග පුනරුත්ථාපන/ වැඩිදියුණු කිරීම් වැඩ ( සීපී 4 ) 2013 ජනවාරි 27 වන විට නිම කිරීමට ව්‍යාපෘතිය විසින් සැලසුම් කර තිබුණි. කෙසේ වුවද මාර්ග පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම පිළිබඳ පස් පිරවීම් හා මාර්ග උරහිස් සකස් කිරීම් 2013 මැයි 30 විගණන පරීක්ෂණ දිනය දක්වාත් නිම කර නොතිබුණි. 2013 මාර්තු 27 දිනට කොන්ත්‍රාත්කරු විසින් බොහෝ දුරට නිම කර තිබුණු බවත් දෝෂ වගකීම් කාලය තුළ ඉතිරි වැඩ ප්‍රමාණය සිදුකරන බවත් මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ දන්වා තිබුණි.

**4.2.4 වල්ලායි සිට අරාලි දක්වා (කි.මී. 0 සිට කි.මී. 27+400 ) බී 437 මාර්ගය පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම**

---

(අ) කොන්ත්‍රාත්කරු විසින් දී තිබුණු ප්‍රකාශයට අනුව කි.මී. 9 + 210 සිට 9 + 780 දක්වා සැලකිය යුතු ලෙස ඇස්පෝල්ට් ඇතිරීම නිම කර තිබුණි. කෙසේ වුවද විගණන පරීක්ෂණය සිදුකරන ලද 2013 මැයි 30 වන විටත් කි.මී. 9 + 210 හි පදිකයේ ඇස්පෝල්ට් මතුපිට පිපිරීම් හා ඇස්පෝලට් මතු පිට රෝද සලකුණු දක්නට ලැබුණි. යොමු කර ඇති කොටසේ ඇස්පෝල්ට් වැඩ 2012 නොවැම්බර් මාසයේ සිදුකරන ලද බවත්, ඇස්පෝල්ට් ඇතිරීම් ක්‍රියාවලියේ සහ අසල බොරළු ඇතිරීමෙහි තිරස් අතට මතුපිට පිපිරීම් නිරීක්ෂණය වුයේ 2013 ජුනි මාසයේ බවත් මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ දක්වා තිබුණි.

(ආ) බෝක්කු හා කි.මී. 10 සිට කි.මී. 27 + 400 ප්‍රවේශ මාර්ග පිළිබඳ මාර්ග වැඩ පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම ( සීපී 6 ) සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද 2012 දෙසැම්බර් 31 වන විටත් එම වැඩ සම්පූර්ණ කර නොතිබුණි. නිම

කළ යුතු දින වන 2013 මැයි 27 දිනට කොන්ත්‍රාත්කරු විසින් සැලකිය යුතු ප්‍රමාණයක් නිම කර ඇති බවට මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ දන්වා තිබුණි.

### 4.2.5 කොන්ත්‍රාත් පැකේජ යටතේ සිවිල් වැඩ

කොන්ත්‍රාත්කරුගේ ඉලක්කයන් හා 2012 දෙසැම්බර් 31 දිනට තථ්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| කොන්ත්‍රාත් පැකේජය | ඉලක්කය | තථ්‍ය ප්‍රගතිය |
|---|---|---|
| | ප්‍රතිශතය | ප්‍රතිශතය |
| 1 | 4.73 | 2.99 |
| 2 | 0.87 | 1.03 |
| 3 | 1.02 | 1.02 |
| 4 | 9.00 | 4.70 |
| 5 | 14.42 | 4.30 |
| 6 | 18.18 | 1.50 |
| 7 | 11.50 | 9.00 |
| 8 | 32.00 | 8.00 |
| 9 | 21.00 | 13.00 |
| 10 | 15.00 | 7.00 |

### 4.2.6 2012 දෙසැම්බර් 31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය

2012 දෙසැම්බර් 31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| | සීපී 1 | සීපී 2 | සීපී 3 | සීපී 4 | සීපී 5 | සීපී 6 | සීපී 7 | සීපී 8 | සීපී 9 | සීපී 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාර්ගයේ දිග (කි.මී.) | 23.35 | 24.14 | 14.5 | 17.4 | 17.4 | 14.0 | 13.0 | 11.0 | 14.5 | 10.6 |
| 2012 දෙසැ. 31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය | 70.5 | 81.6 | 99.2 | 90.9 | 99.5 | 80.2 | 98.0 | 72.6 | 91 | 80 |

### 4.3 පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම් වාර්තා පවත්වා ගැනීම

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) කාර්ය සාධනය

(ඈ) වාහන උපයෝජනය